"අවුරුදු ජය යි වගේ"

පුංචි මහත්තයා මහත්තයටයි, මහතුන් මහත්තයටයි පදමට වැදිලා.

"නැතුව ? නැතුව ? යුද්ධෙත් අහවරවෙච්චි එකේ ජය නැත්තෙ මොකද අවුරුද්ද ?" පුංචි මහත්තයා මහත්තය කිව්වෙ තොල කට පිහදාන ගමන්.

යුගයේ විකට චරිත පණගැන්වූ ජෝ අබේවික්‍රම වැනි ප්‍රවීණයින්ට ඉඳුරාම වෙනස් මඟක ගිය රඟපෑමකි ඔහු කළේ. ඔහුට ආවේනික වූ ගායන හැකියාව ද ඊට කදිමට පෑහිණ. එඩී ජයමාන්නගේ පටන් පැවත ආ එකී රංගන ශිල්පී පරපුරේ සම්පූර්ණ නාමාවලියක් ඉදිරිපත් කිරීම වෙනම ම කාර්යයකි.

ප්‍රෙඩී සිල්වා ශිල්පියාගේ බොහෝ ගී රචනා කළ

# මහත්තුරුන්ගේ කතා

## විමලේ, කුලේ කැළේ මළේ මොළේ මැලේරියාවෙන්

"හැබැයි ඉතින් මේ වාගෙ වෙලාවට අපට තිබුණ "බයිට්" එකක් තමයි නැතුව ගියේ....." මහතුන් මහත්තයා බැදපු කඩල ටිකක් අතට ගත්ත. " පුටුවක් අරන් මෙහෙන් ඇඳිගත්තනං......."

"දෙකක් දාගත්තම අපේ අය කටගැස්සමට ගන්නේ "ආගම" "ජාති ආලේ" වගේ දේවල්නෙ" පන්හිඳයි, පින්සලයි මහත්තුරු දෙන්නට එකතු වුණා.

"මොණවද මුන්නැහේ අර ලියන්නෙ ? වැදගම්මක් තියෙනව ද ඕවයේ ?" මහතුන් මහත්තයා පන්ට ඇඟිල්ල දික්කලා.

"මේක ඕවා කතා කරන්න වෙලාව නෙවීනේ. එක්කෝ අපිත් දෙකක් දා ගන්නකල් ඉන්න. එතකොට පුලුවන් වේවි ඔය ප්‍රශ්ණෙට උත්තයක් බඳින්න." පන් හිනාවුණා.

"මං නං කැමතියි. මොකක් ද ඒවයේ තියෙන වැරැද්ද ?" පුංචි මහත්තයා මහත්තයා "සැල්" එකක් ඇරියා.

"එදිනෙදා අප අත්විඳින අපට දැනෙන දේ, අප අගයන දේ, කිසිවකුගේ අවධානයට යොමු නොවිනැයි අපට හැඟෙන දේ පිළිබඳව කෙටි සටහනක් තැබීමට අපගේ මේ ලියවිල්ලේ අරමුණ. ඒ අතරින් විටෙක නිර්මාණාත්මක යමක් ඉදිරිපත් කිරීමට ද උනන්දු වන්නෙමු අපි." ටිකක් වැදුනම පන් කතා



සිසිර දිසානායක

කරන්නෙත් ලියන භාෂාව. පුංචි මහත්තයා මහත්තයටයි, මහතුන් මහත්තයටයි "ලතින්" වගේ පන්ගේ කතාව.

"ඒක නෙවි අර "නරලොව හොල්මන් තිරය", " විනෝද සමය" ගැන ලියපු ලියවිල්ල ඉවරයක් කරගන්න බැරි වුණා නේද ?" පින් නින්දෙන් ඇහැරිලා වගේ.

"ඒකට මාත් කැමති....." පුංචි මහත්තයා මහත්තයා මහත්තැන් කබාය ගලවලා එහා මේසේ පුටුවක වැනුවා.

"එකට බොහෝ සෙයින් ජනප්‍රියත්වයට පත්වූ " විනෝද සමය" වෙනුවට ආදේශ කළ හැකි වෙනත් විකට අංගයක් තිබුණෝම නැති සේය. එසේ වුව ද මීට වසර හය හතකට පමණ පෙර පටන් රූපවාහිනී හා ගුවන් විදුලි මාධ්‍යයක් තුලින් විකටාංග ඉදිරිපත් කළ ශිල්පීන් දෙදෙනෙක් මේ වන විට රසික ප්‍රේක්ෂකයින්ගේ ආදරය දිනා ගැනීමට සමත්ව සිටිති. පසුගියදා මෙල්බර්න් නුවරදී "රාජ සභාව" ඉදිරිපත් කළ ගුණදාස මධුරසිංහ සහ මහින්ද පතිරගේ යන ශිල්පීන් දෙපළයි ඒ. හුදෙක් රසිකයින් පිනවීමට පමණක්ම සීමා නොවී ඥාණනය කිරීමේ වගකීමද කරට ගෙන සිටිති ඔවුහු."

"අපට තේරෙන මළ දානයක් කියනවා හලෝ......" පුංචි මහත්තයා මහත්තයාට මල පැන්නා.

"අපි ප්‍රෙඩී සිල්වා මහත්තයා ගැන කියමු." පින් ජාම බේර ගන්න යෝජනා කළා.

විකට හා උපහාසාත්මක ගී ගායනයේදී මෙන් ම රංගනයේදී ද අප අතරින් වියෝ වූ ප්‍රෙඩී සිල්වා කලාකරුවා දැක්වූයේ අපූරූ හැකියාවකි. මුල්

ප්‍රේමකීර්ති ද අල්විස් ගේය පද රචකයාණන් ද, ඒ පදමාලා බොහෝමයක් තනු ගැන්වූ වික්ටර් රත්නායක සංගීත වේදියාණන්ව ද මෙහි ලා සටහන් කරනු වටියි.

පසු කාලීනව රංගනය හා ගායනය කැටිව වේදිකාගත වූ හා රූපවාහිනී තිරගත වූ උපහාස කලාකරුවන්



දෙදෙනෙකු වශයෙන් රෝහණ බැද්දගේ සහ බන්දුල විජේවීර ප්‍රවීණයන් දෙපළ සිහිපත් කළ යුතුවේ. ඒ සමගාමීව වේදිකාවේ ප්‍රාසාංගිකත්වය තවදුරටත් ඉදිරියට ගෙන ආ පිරිසක් වූයේ ලයනල් රන්වලයන් ප්‍රමුඛ පිරිසයි. රන්වලයන්ගේ අවෑමෙන් එතුමන්ගේ පුත් සහන් එකී සද්කාර්යයට උරදෙමින් සිටියි. පන් කියවිල්ල නවත්තලා ලියන්න පටන් ගත්තා. පින් කො-හෙන්දෝ කොල ටිකකුයි පෑනකුයි හොයලා ගෙනත් දුන්නා. පුංචි මහත්තයා මහත්තයයි මහතුන් මහත්තයයි ඉස්සරහ පන් කියවන්න ගියානං පච වෙන්නයි වෙන්නේ. ඒ කියවන දේවල් කොලවල ලියවා ගත්තම "සන්නසට" වත් යවන්න බැරියැ.

පන් ලියන අතරේ පුංචි මහත්තයා මහත්තයයි, මහතුන් මහත්තයයි පන්ට බාදා කරන එක නවත්තා ගන්න පින් මොන " මොනවා හරි කිය " කියා ඒ දෙන්නව කතාවට ඈඳා ගත්තා.

"මහත්තුරු දන්නවද අපේ හිතවත් අයියා කෙනෙක් ඉන්නවා කැලිෆෝනියාවේ. උන්නැහේ අපිව දන්නෙ ඉස්කෝලෙ යන කාලේ ඉඳන්. ඒ කාලේ අපි උන්නෙ කිරුළපනේ. මේ කියන අයියත් ඒ අහල පහළ කෙනෙ-ක්. ඉතින් "සන්නස" වෙබ් සයිට් එකෙන් අපි ගැන දැනගෙන අපට කතා කරනවා. උන්නැහෙ මරු කතා කාරයා. මොකද කියන්නෙ ? කැමතිද උන්නැහෙගේ කතාවක් දෙකක් අහන්න ?

"හර්ස්.... හර්ස්..... " මහතුන් මහත්තයා මේසෙ ඔළුව ගහගෙන ගොරවා " ගොරවා දොයි !.

"මං කැමති  මං කැමති ....." පුංචි මහත්තයා මහත්තයා අමාරුවෙන් ඔළුව කෙළින් කරගත්තා.

"ඔන්න අහගන්න. මේ අපේ කැලිෆෝනියාවේ ඉන්න නිමල් අයියගේ කතා.

"මල්ලි මේ ඇවිල්ලා එක්දාස් නවසිය බර ගණන්වල කතා.

ඒ දවස්වල ලංකාවෙ ලංකාදීප පත්තරරේ වැඩකරන මහත්තැන් කෙනෙක් උන්නා. උන්නැහේ මගේ පොඩි පොඩි හැකියාවල් ගැන දැනගෙන උන්නා. මොකද උන්නැහෙගේ පුත්‍රයා මගේ පන්තියේ මිත්‍රයෙක්. ඉතින් උන්නැහෙ මට පැවරුවා පත්තරේට අදාල පුංචි වැඩක්. ඒ දවස්වල පත්තරේට එවන ප්‍රවෘත්ති කියවලා




සිසිර දිසානායක

ඒවාට මාතෘකා හදන එකයි මගේ වැඩේ.

"ඒ දවස්වල ඔය මැණික් ගරන්න ගිය කුලරත්නයි විමලරත්නයි කියලා දෙන්නෙක් කැලේදී මොළේ මැලේරියාව හැදිලා මළා. මොකද්ද දන්නවද මම දුන්න හෙඩිම ?"

"විමලේ, කුලේ කැළේ මළේ මොළේ මැලේරියාවෙන් "

තවත් එක නිව්ස් අයිටම් එකක් තමයි අඹේවෙල පැත්තේ අලුත් තණකොල වර්ගයක් හදපු එක. මෙන්න හෙඩිම :

"තැන - තැන තණ තැනිතලා තනති !"

එක අනතුරකින් කාර් එකක් බේරේ වැවට ම වැටුණා. හය දෙනෙකුගෙන් එක්කෙනයි බේරුණේ. අනික් පස් දෙනාම බේරේ වැටිලා මළා. මෙන්න ප්‍රවෘත්තියේ මාතෘකාව, අහගන්න.

"එකෙක් බේරේ - පහක් බේරේ"

නිමල් අයියගෙ වැඩපොළේ වැඩ කළමණාකාර මහත්තයා අස්වෙලා ගිය දවසේ උන්නැහෙට කතාවක් කරන්න ආරාධානා ලැබුණා. කතාවක් වෙනුවට නිමල් අයියා කිව්වේ මෙන්න මේ කවිය.

ආදරණීය වැ. ක.<br>
ඔබ ගිය දාට අපට දුක<br>
පා. ක. සේ. ම. ක. " මු. ක.<br>
අපට සළකාවීදැයි ඇත සැක

වැ. ක. කිව්වෙ වැඩ කළමණාකාර මහත්තයාට. පා. ක. කිව්වෙ පාළන කළමනාකාර මහත්තයට. සේ.ම.ක. කිව්වේ සේවක මණ්ඩල කළමණාකාර මහත්තයාට. මු.ක. කිව්වෙ මුදල් කළමණාකාර මහත්තයාට. දැන් තේරුණාද ? පින් පුංචි මහත්තයා මහත්තයාගෙන් ඇහුවා.

උන්නැහෙ ගැස්සිලා ඇහැරුණා.

"මෙහෙම මහත්තුරුන්ට කතා කියනවට හොඳයි ඒ කට බිම උලා ගත්තනං" පින් හිමීට පන් තවමත් ලිය ලියා උන්නු ලියවිල්ලට එබුණා.

උපහාසය සිංහල භාෂාවට එක් වූයේ අද ඊයෙක නොවේ. අපගේ භාෂාවට ම විශේෂිත වූ ලක්ෂණ උපහාස නිර්මාණ කලාවේ උන්නතිය සඳහා බෙහෙවින් ම බලපාන්නේය. එහිදී ද විවිධ වූ ශබ්ද රස නංවමින් අපගේ හෝඩියේ අක්ෂරයන් පාන්නා වූ පෙළහර විශ්මය ජනකය.

"පන් නිමල් අයියාගේ මාතෘකා අහගෙන ඉඳලද කොහෙද" පින් තමුන්ටම කියා ගත්තා.

"කාවය්‍යකරණයේදී එළිසමය රැකීමෙන් ඒවා ගායනයේදී නංවන ශබ්ද මාධූර්යය අන් භාෂාවල ඇති එකී හැදියාවන් අභිබවා යන බවය. හැඟීම අන් භාෂාවන් පිළිබඳව නිසි අවබෝධයක් නොමැති නිසාවෙන් එය අවධාරනය කරන්නට අපොහොසත් වන්නෙමු අපි. කෙසේ වුව ද අපගේ නිර්මාණකරුවන් ඒ විශේෂිත වූ ලක්ෂණ ඇසුරින් නිමවන දෑ ද අපූර්වජනකයි. ඒ සියල්ල අප වහරන සිංහලයට උපහාරයක් ම වන්නේය. අභිමානයක් ම වන්නේය." පන්ගේ අකුරු ඇද වී ගියා කියවන්න බැරි තරමට ම.

"පරණවිතාන මහත්තයාවත් ගෙන්න ගන්න වෙනවා මේවා කියවගන්න." පින් තමන් කුරුටු ගගා හිටිය දිහා ආයෙත් බැලුවා."

"ලෑලි වලේ ලූලා" තනි අකුරෙන් "ලේ්ඃා"

"ක්‍රීකෑ කොකා" තනි අකුරෙන් "ක්‍රේ්ඃා"

"හරියට ඇබ්ස්ට්‍රැක්ට් චිත්‍රයක් වගේ


**Tripple Gem**
**Video & Audio Production**
Videography and Photography
Keep your memories forever
Weddings
Parties
Functions



Vijitha
Tel - 0412 083 876/ 94495635

**SRI LANKAN DENTISTS**

Dr. Tusitha Muthuhetti BDSc
Dr. Anne Perera BDSc

**KEILOR DENTAL GROUP**

PH. 9336 2062

49 MILLEARA ROAD,
KEILOR EAST,
VICTORIA 3033